12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka ISSN 2362-0412

# උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය ආශ්‍රිතව සිදුකෙරෙන කිරි අම්මාවරුන්ගේ දානය පිළිබඳ අධ්‍යයනයක්

*ඩබ්.ටී.එච්. හර්ෂණ වීරසිංහ*
*සිංහල අධ්‍යයනාංශය , මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

*harshanahasitha@gmail.com*

**සාරසංක්ෂේපය**

කිරි අම්මාවරුන්ගේ දානය පුරාණයේ සිට ම ඇත ගම්වල පැවත එන චාරිත්‍රයකි. කිරි අම්මාවරුන්ගේ දානය පිළිබඳ විශ්වාසය පත්තිනි දේවිය හා සම්බන්ධ වේ. ග්‍රාමීය සමාජයේ අභිචාර විධි අතර පත්තිනි වන්දනාවට හිමි වනුයේ ප්‍රමුඛ ස්ථානයකි. මෙම චාරිත්‍රය සිදුකරන්නෝ තම අභිමතාර්ථ සහ අපේක්ෂා සාධනය කරගැනීමට පත්තිනි දේවිය දැඩි ලෙස විශ්වාස කරති. මෙම පත්‍රිකාවේ මූලික පරමාර්ථය වූ කලී උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය ආශ්‍රිත සිදුකෙරෙන කිරි අම්මාවරුන්ගේ දානයේ වැදගත්කම විමසා බැලීමය. කාන්තාවකට දරු උපතක් සිදුවීමට පෙරාතුව ද පැපොල හෝ සරම්ප වැනි බෝවන රෝගයක් වැළඳුණු විට ද කුඩා දරුවෙකුගේ අසනීප තත්වයකදී ද ඉක්මනින් නිරෝගී සුවය පතා කිරි අම්මාවරුන් සඳහා බාරයක් වීම පුරාණයේ සිට පැවත ආ සිරිතකි. මෙලෙස ඇති වන රෝග දෙයියන්ගේ ලෙඩ ලෙස හඳුන්වනු ලබයි. එලෙස හඳුන්වනු ලබන්නේ දෙවියන් කෝපවීමෙන් සිදුවන ඵලයක් ලෙස බෝවන රෝග සලකු බැවින්ය. මේ ආකාරයට බාරහාර වීමෙන් පසු සුදුසු දිනයක් යොදා ගෙන කිරි අම්මාවරුන්ගේ දානය සිදුකරනු ලබයි. එහිදී ගැමි ජනයා කිරි අම්මාවරුන්ගේ දානය ආරම්භයේ සිට අවසානය දක්වා සිදුකරන ලබන පුද සිරිත් චාරිත්‍ර චාරිත්‍රවල ප්‍රදේශයෙන් ප්‍රදේශයට ආවේනික ලක්ෂණ හා සමානතා දක්නට ලැබෙයි. උග්ගල් අලුත්නුවර කිරි අම්මාවරුන්ගේ දානය ද වැදගත් වන්නේ එය සිදුකරනු ලබන ආකාරය, චාරිත්‍ර චාරිත්‍ර මෙන්ම එහිදි ගායනා කරනු ලබන ඇතැම් කවි වල සාහිත්‍යයමය වටිනා කම නිසා ය. ඇතැම් කවි වල මෙම ප්‍රදේශයේ නාමය සඳහන් වන අතර ඒවා බොහෝ ප්‍රදේශවල ප්‍රචලිත කවි වීම විශේෂිත්වය වී ඇත. මේ එවැනි කවියකි. "කුඹල්මුල්ල බොල්තුඹ දේවාලේ අලුත්නුවර ගලගම දේවාලේ..". එහි "අලුත්නුවර"ලෙස මෙම ගමේ නම සඳහන් වේ. මෙය එම ගමම ද යන්න තවදුරටත් තහවුරු වන්නේ කුඹල්මුල්ල බොල්තුඹේ, ගලගම, කිරිඳිගල, මොරහැළ ආදී ගම් වල නම් සඳහන් වීම නිසාය. මෙම ගම් උග්ගල් අලුත්නුවරට ඉතා ආසන්නයේ පිහිටි ගම්වල නාමයන්ය. මේ නිසා කිරිදානය සම්බන්ධව ඓතිහාසික වටිනාකමක් මෙම ගමට ඇති බව මේ අනුව පෙනේ. අධ්‍යයනය සඳහා දත්ත සම්පාදනය කර ගැනීමේ දී මූලික වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ සම්මුඛ සාකච්ඡා හා සාහිත්‍ය මූලාශ්‍රය සඳහාය. දත්ත හා විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට ලේඛනය පරිහරණය කරන ලදී. මෙම පර්යේෂණයේදී බලංගොඩ උග්ගල් අලුත්නුවර දේවාලය ආශ්‍රිත සිදුකරන කිරි අම්මාවරුන්ගේ දානය පිළිබඳ විශ්ලේෂණයකට භාජනය කරන ලදී.

*ප්‍රමුඛ පද: උග්ගල් අලුත්නුවර කතරගම දේවාලය, කිරි අම්මාවරුන්ගේ දානය, සිරිත් විරිත්, පත්තිනි වන්දනය,සංස්කෘතිය*